

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ
සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය
වෙනස් වෙමු
වෙනස් කරමු
සුපිළිපන්න සතිය:
යහපත් පාලනයක් සඳහා
CLEAN
SRI LANKA
පිරිසිදු ශ්‍රී ලංකා වැඩසටහත
ක්ලීන් ශ්‍රී ලංකා:
පිරිසිදු පරිසරයක්

## ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැනීමේ අමාත්‍යාංශය

2026 - ජූලි මස 27 වන සඳු දින

***<u>ආයතනික සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය - සුපිළිපන් නීතිගරුක රාජ්‍ය සේවයක්</u>***

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය ‘‘සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්’’ උදෙසා වන ජාතික සුපිළිපන්න සතියේ ආරම්භය අතිරේක ලේකම් (පරිපාලන) රාධා නානයක්කාර මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2026 ජූලි මස 27 වන දින ආරම්භ විය. එහිදී, එම අමාත්‍යාංශය සහ එයට අනුබද්ධ ආයතනයන්හි මාණ්ඩලික කාර්ය මණ්ඩල සහ නිලධාරීන් පෙ.ව. 9.00ට සාමූහිකව සුපිළිපන් ප්‍රතිඥාව ලබා දීම සිදු කරන ලදී.

“සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්’’ උදෙසා වන සුපිළිපන්න සතියේ 2026 වසරේ ජූනි මස 29 වන පොහොය දින අප අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් වූ අතර, එය ‘‘මානව ගරුත්වයෙන් පිරි පුපිළිපන් සමාජයක්’’ යන්න තේමා කර ගන්නා ලදී. ඒ අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය සහ ආබාධිත සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය විසින් පොහොය දිනයන්හි දී සිදු කරන විශේෂ කටයුතු සුපිළිපන්නභාවය පාදක කර ගනිමින් සහ එහි වැදගත්කම විදහා දැක්වෙන අයුරින් සිදු කිරීමට බලාපොරොත්තුවන බව ප්‍රකාශ කරන ලදී.

සුපිළිපන්න සතියේ සැලසුම් කළ අනිකුත් ක්‍රියාකාරකම් ලෙසින් ජූලි මස 31 වන දින ‘‘සුපිළිපන් තිරසාර හරිත සංස්කෘතියක්’’ යන අරුතට සමගාමී ක්‍රියාකාරකම් ලෙස රාජකාරි ස්ථානයේ අභ්‍යන්තර සහ බාහිර පරිශ්‍රයන් සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතුවල නියැලීම සුදුසුබවට තීරණය විය

රාජ්‍ය සේවයේ පුපිළිපන්නභාවය රැක ගැනීමත්, ඒතුළින් යහපත් සමාජයක් ගොඩ නැගීමත්, අරමුණ ඇතිව සියලු නිළධාරීන් දෛනික රාජකාරි අරඹන ලදී.

අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන් විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්











2026 - ජූලි මස 28 වන අඟහරුවාදා දින

***මූල්‍ය ඩිජිටල් ව්‍යවසායකත්වය හා තාක්ෂණික සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය - සුපිළිපන් ඩිජිටල් රාජ්‍ය සේවයක්***
***සුපිළිපන් පාගමන***

Clean Sri Lanka හා ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සංවිධාන කළ සුපිළිපන් පා ගමන සඳහා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන) ගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශය සහ එයට අනුබද්ධ ආයතන 10 නියෝජනය කිරීම සඳහා සෑම ආයතනයකින්ම අවමය 02 කුට නොඅඩු සංඛ්‍යාවක් මෙම පාගමන සඳහා සහභාගී කරවීමට කටයුතු සලස්වන ලදී.





2026 - ජූලි මස 30 වන බ්‍රහස්පතින්දා දින

***මෙහෙයුම් යටිතල පහසුකම් සේවා සැපයීමේ සහ ශ්‍රම සුපිළිබන්නභාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය - සුපිළිපන් පාරදෘෂ්‍ය මෙහෙයුම් ජාලයක්***

"සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික මෙහෙයුම ක්‍රියාවට නැංවීම යටතේ අද දින ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ දී රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක විය. මෙම අවස්ථාව අමාත්‍යාංශයේ අතිරේක ලේකම් රාධා නානායක්කාර මහත්මිය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධම්මික මුතුගල මහතා, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිලිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය යන අයගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.











2026 - ජූලි මස 31 වන සිකුරාදා දින

***පාරිසරික සම්පත් කළමණාකරණය ග්‍රාමීය සහ ප්‍රජා සවිබල ගැන්වීමේ සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීම් දිනය - සුපිළිපන්න තිරසාර හරිත සංස්කෘතියක්***

අමාත්‍යාංශ කාර්යාලයේ බාහිර පරිශ්‍රයේ සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු ක්ලීන් ශ්‍රී ලංකා ඩෙංගු මර්දන සතිය තුළ දී පසුගිය ජූනි මස 24 වන බදාදා දින සිදු කරන ලදී. එම හේතුවෙන් අමාත්‍යාංශයේ අභ්‍යන්තර පරිසරයේ සුද්ධ පවිත්‍ර කටයුතු ජූලි මස 31 වන අද දින මධ්‍යහාන 12.00 න් පසු සිදු කිරීමට නියමිත වේ.

එසේම අමාත්‍යාංශ කටයුතු ඩිජිටර්කරණය කිරීමේ මූලික පියවරක් ලෙස අමාත්‍යාංශ ලේඛනාගාරය Digitalize කිරීමට තීරණය කෙරිනි. ඒ අනුව අමාත්‍යාංශයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණික සහකාර සජිත් නිලංග මහතා විසින් ලේඛනාගාරය වෙනුවෙන් නව Digitalize System එකක් නිර්මාණය කරන ලදී. එම Digital System එක අද දින එළිදැක්වීමට බලාපොරොත්තු වේ.

එසේම ඵලදායිතා පුහුණු වැඩමුළුවක් අද දින සංවිධානය කරන ලදී. කාර්යාලයීය සේවයන්ගේ ඵලදායිතාවය ඉහළ නැංවීම තුළින් රාජකාරි කටයුතු වඩා කාර්යක්ෂමව සිදු කර ගැනීමටත්, ඒ තුළින් ප්‍රශස්ථ සේවයක් ලබා දීමටත් හැකි වේ යැයි බලාපොරොත්තු වේ.

# අමාත්‍යාංශය අනුබද්ධ ආයතනයන්හි සුපිළිපන්න සතියේ දායකත්වය

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

2026 - ජූලි මස 27 වන සඳු දින

***ආයතනික සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය  - සුපිළිපන් නීතිගරුක රාජ්‍ය සේවයක්***

ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් සුපිළිපන්නභාවය පිළිබඳ ප්‍රතාඥාව ලබා දීම සහ පරමාදර්ශ 10 ඇතුළත් බැනරය ප්‍රදර්ශනය කිරීම









2026 - ජූලි මස 28 වන අඟහරුවාදා දින

***මූල්‍ය ඩිජිටල් ව්‍යවසායකත්වය හා තාක්ෂණික සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය - සුපිළිපන් ඩිජිටල් රාජ්‍ය සේවයක්***

අඛන්ඩතාව, යහපාලනය හා සුපිළිපන්න භාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක්  - සම්පත් දායකත්වය මහාචාර්ය ප්‍රතිභා මහානාම මහතා










2026 - ජූලි මස 29 වන බදාදා දින

***<u>අධ්‍යාත්මික, ආචාරධර්මීය, සංස්කෘතික සහ සමාජීය සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය</u>***

මානව ගෞරවය සුරකින සදාචාරාත්මක සමාජයක් යන තේමාව යටතේ සම්පත් දායකත්වය පූජ්‍යපාද සුදස්සන ස්වාමීන් වහන්සේ



2026 - ජූලි මස 30 වන බ්‍රහස්පතින්දා දින

***මෙහෙයුම් යටිතල පහසුකම් සේවා සැපයීමේ සහ ශ්‍රම සුපිළිබන්නභාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය - සුපිළිපන් පාරදෘෂ්‍ය මෙහෙයුම් ජාලයක්***

"Clean NISD – Integrity Campus Day" ( ශ්‍රම දානය සහ පරිසර සංරක්ෂණ වැඩසටහන)

සුපිළිපන්නභාවය පිළිබඳව අමාත්‍යාංශය විසින් ලබා දුන් බැනරය ප්‍රදර්ශනය කිරීම










2026 - ජූලි මස 31 වන සිකුරාදා දින

***පාරිසරික සම්පත් කළමණාකරණය ග්‍රාමීය සහ ප්‍රජා සවිබල ගැන්වීමේ සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීම් දිනය - සුපිළිපන්න තිරසාර හරිත සංස්කෘතියක්***

පරමාදර්ශ 10 සහිත බැනරය ප්‍රදර්ශනය කිරීම සහ සුපිළිපන්න සතියේ ප්‍රගතිය සමාලෝචනය

## <u>සමාජ සේවා දෙපාර්තමේන්තුව</u>

අද්‍යාත්මික, ආචාරධාර්මික, සංස්කෘතික හා සාමාජීය සුපිලිපන්භාවය ප්‍රදර්ශනය කිරීමේ දිනය නිමිත්තෙන් මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනයේ අභ්‍යාසලාභීන් ආගමික කටයුතු වල නිරත කරවීම.






2026 - ජූලි මස 27 වන සඳු දින

***<u>ආයතනික සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය - සුපිළිපන් නීතිගරුක රාජ්‍ය සේවයක්</u>***















මානව ගරුත්වයෙන් යුත් සුපිළිපන් සමාජයක් නිමිති කරගනිමින් තෙළඹුයාය  වෘත්තීය පුහුණු ආයතනයේ දරුවන් තෙළඹුයාය විහාරස්ථානය වෙත පාගමනින් ගොස් ආගමික වතාවත්හි නිරතවීම










සුපිලිපන් සතිය නිමිත්තෙන් විහවි පුහුණු ආයතනයේ අභ්‍යාසලාභීන් සහ කාර්ය මණ්ඩලය එක්ව පවත්වන ලද භාවනා සහ බෝධි පූජා වැඩසටහන









සුපිලිපන්න සතිය - මඩකළපුව වෘත්තීය පුහුණු ආයතනය









සුපිලිපන්න සතිය - අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය









සුපිලිපන් සතිය වෙනුවෙන් කිළිනොච්චි වෘත්තීය පුහුණු ආයතනය









සුපිලිපන්න සතිය වෙනුවෙන් පුවක්පිටිය ජයවිරු සමාධි නිවහන

2026.07.29 බදාදා (ඇසළ පොහොය දිනය)

සේවාලාභීන් විසින් සමස්ත ආයතනයේ රාත්‍රී ආහාරය වෙනුවෙන් ලබා දුන් රොටී දන්සල





සුපිලිපන්න සතිය වෙනුවෙන් සීදූව වෘත්තිය පුහුණු ආයතනය

උදේ වරුවේ පැවති බෝධි මන්දිරය අවට ශ්‍රමදානය, දහවල් අභ්‍යාසලාභීන් ලියනගේමුල්ල විහාරස්ථානයට රැගෙන යාම හා දහවල් දානය ලබා දීම . සහ සවස් වරුවේ පැවැත්වූ බෝධි පූජා පිංකම .










ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක් උදෙසා ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ බොරැල්ල ප්‍රධාන කාර්යාලයේ හා පිළිමතලාව මධ්‍යස්ථානයේ නිලධාරීන් ක්‍රියාකාරීව සම්බන්ධ වීම

අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන් ප්‍රතිඥා දී වැඩ ආරම්භ කිරීම
සුපිළිපන්නභාවය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ විසින් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම
සුපිළිපන් පා ගමන සඳහා සහභාගී වීම
පරිසරය වෙනුවෙන් පැළ සිටුවා රුක් රෝපන වැඩසටහනක් සිදු කිරීම
ආයතන භූමිය හා අවට පරිසරය පිරිසිදු කිරීම












28 දින - අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන් විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්

වැඩිහිටි ජාතික මහ ලකෙම් කාර්යාලයට අනුබද්ධ කතරගම “සිල්ව ඒජ්” ආයතනයේ කාර්ය මණ්ඩලයද ජූලිමස 28 වන දින සිය සුපිළිපන්න ප්‍රතිඥාව ලබා දෙන ලදී. මෙම උත්සවය ස්ථානභාර නිලධාරි ඉදුනිල් කෞෂල්‍යා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කල අතර ඒ සඳහා එම ආයතනයේ සියලුව කාර්ය මණ්ඩලය සහභාගී වන ලදී.










වැඩිහිටි ජාතික මහ ලකෙම් කාර්යාලයට අනුබද්ධ පන්නල "වෙල්කම් විලේජ්" වැඩිහිටි නිවාසයේ සුපිළිපන් සතිය වෙනුවෙන් සුපිළිපන්න දිවුරුම ලබා දුන් අතර, එහි දී අදාළ නිලධාරී දැනුවත් කිරීම සිදු කරන ලදී. එසේම සුපිළිපන්නභාවය අරමුණු කර ගනිමින් හා ආගමික වතාවත් සිදු කිරීමේ දී “පිරිසිදු රාජ්‍ය පාලනයකක් සඳහා රාජ්‍ය සේවකයාගේ වගකීම” තේමා පාඨය අනුව ධර්ම දේශනය සිදු කරන ලදී. මෙම වැඩසටහන පන්නල වෙල්කම් විලේජ් වැඩිහිටි නිවාසය භාර වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි ජේ.එල්.සී සුදර්ශන මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කල අතර, මේ සඳහා දිස්ත්‍රික්කය නියෝජනය කරන වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සහ විහාරාධිපති හිමි නිවාස කර්ය මණ්ඩලය හා නේවාසික වැඩිහිටියන් සහභාගීවන ලදී.










